ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 ජූලි මස 14 වැනි දින |

## 2014 මැයි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

### සමස්ත නිරීක්ෂණ

විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය ශක්තිමත් කරමින් 2014 වසරේ මැයි මාසයේ දී, වෙළෙඳ හිඟය අඛණ්ඩව අඩු විය. අපනයන ආදායම ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් ඉන්ධන ආනයනයේ අඩු වීම හේතුවෙන් ආනයන වියදම අඩු විය. මෙම වර්ධනය සමඟ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණයන්හි ඉහළ ලැබීම්, ඉහළ ගිය සංචාරක ඉපැයීම් සහ මූල්‍ය ගිණුම වෙත වූ අඛණ්ඩ ලැබීම් හේතුවෙන් 2013 වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව 2014 වසරේ පළමු මාස පහ තුළදී ගෙවුම් තුලනයේ හිතකර අතිරික්තයක් වාර්තා විය.

### ගෙවුම් තුලනයේ වෙළෙඳ ගිණුම

2014 මැයි මාසයේදී අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 882 ක් දක්වා සියයට 11.1 කින් වර්ධනය වූ අතර, ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,275 ක් දක්වා සියයට 17.6 කින් පහත වැටුණි. ඒ අනුව, 2014 මැයි මාසයේදී වෙළෙඳ හිඟය එ.ජ. ඩොලර් මිලියන 393 ක් දක්වා සියයට 47.9 කින් අඛණ්ඩව අට වන මාසයටත් අඩුවිය. 2014 වසරේ පළමු මාස පහ තුළ සමුච්චිත වෙළෙඳ හිඟය සියයට 19.3 කින් අඩු වූ අතර, සියයට 15.7 කින් අපනයන ආදායම වර්ධනය වීම සහ සියයට 1.5 කින් ආනයන වියදම අඩුවීම මේ සඳහා හේතු විය.

## අපනයන ක්‍රියාකාරිත්වය

2014 මැයි මාසයේදී අපනයන වර්ධනය සඳහා සියළුම ප්‍රධාන අපනයන කාණ්ඩයන්ගේ ප්‍රසාරණයන් දායක විය. එසේවුවද, අපනයයේ සමස්ථ වර්ධනය සඳහා විශාලතම දායකත්වය කාර්මික අපනයන්ගෙන් ලැබුණු අතර, අනතුරුව කෘෂිකාර්මික අපනයන් දායක විය. සෑම උප කාණ්ඩයකම පාහේ යහපත් ක්‍රියාකාරිත්වයන් පිළිබිඹු කරමින් කාර්මික අපනයන ආදායම පසුගිය වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 639 ක් දක්වා සියයට 7.7 කින් වර්ධනය විය. කාර්මික අපනයන වර්ධනයෙහි ප්‍රධානතම නියමුවා ලෙස රෙදිපිළි හා ඇඟළුම් අපනයන 2014 මැයි මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 365 ක් දක්වා පසුගිය වසරට සාපේක්ෂව සියයට 14.5 කින් වර්ධනය වූ අතර, සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන යන වෙළෙඳපොළ ද්විත්වය කෙරෙහිම කළ අපනයන්ගේ සැළකිය යුතු වර්ධනය මේ සඳහා හේතු විය. පසුමෙහෙයුම් කළමනාකරණය, වෙළෙඳ නාම ස්ථාපිත කිරීම සහ ගුණාත්මකභාවයෙන් යුතු ඇඟළුම් කලට වේලාවට සපයන්නකු ලෙස වර්ධනය කරගෙන ඇති කීර්තිය වැනි උපක්‍රම මගින් ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය තම එකතු කළ වටිනාකම වර්ධනය කරගෙන ඇත. රබර් නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 78 ක් දක්වා සියයට 14.6 කින් වර්ධනය වූ අතර, ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රබර් නිෂ්පාදිතය වන රබර් ටයර් අපනයනයෙහි වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. රබර් නිෂ්පාදිත නිපයුම්කරුවන්හට ප්‍රතිලාභ ලබාදෙමින් අමු රබර් මිල ගණන්හි පසුගිය වසර 5 තුළ පැවති අඩුම අගය 2014 මැයි මාසයේදී වාර්තා කරන ලදී. යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, ආහාරපාන හා දුම්කොළ සහ සම් භාණ්ඩ නිෂ්පාදිත අපනයන ආදායම් ද කාර්මික අපනයන ආදායමේ වර්ධනයට දායක විය. මේ අතර, ප්‍රවාහන උපකරණ සහ ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම් පිළිවෙළින් සියයට 77.6 කින් සහ සියයට 40.0 කින් අඩු වූ අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති ඉහළ අගය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

තේ සහ පොල් අපනයනයන්ගෙන් ලැබුණු සැලකිය යුතු දායකත්වයත් සමග 2014 මැයි මාසයේදී කෘෂිකාර්මික අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 240 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 21.2 කින් වර්ධනය විය. පොල් අපනයනයෙන් ලද ආදායම එ.ජ. ඩොලර් මිලියන 30 ක් දක්වා සියයට 91.3 කින් ශීඝ්‍ර ලෙස වර්ධනය වූ අතර, මේ සඳහා පොල් මද නිෂ්පාදිත අපනයන ආදායමේ වර්ධනය මූලික විය. පෙර වසරේ පැවති යහපත් කාලගුණික තත්ත්වය තුළින් පොල් නිෂ්පාදනය කෙරෙහි වූ බලපෑම, 2014 වසරේදී පොල් අපනයනයේ හිතකර සංවර්ධනය මගින් පිළිබිඹු වේ. 2014 මැයි මාසයේදී තේ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 141ක් දක්වා


සියයට 9.7 ක යහපත් වර්ධනයක් වාර්තා කරන ලදී. මෙය තේ අපනයන පරිමාවේ සියයට 5.5 ක වර්ධනය සහ තේ අපනයන සාමාන්‍ය මිලෙහි සියයට 4.0 ක වර්ධනය යන දෙකෙහිම සංයුක්ත ප්‍රතිඵලයකි. කෙසේවුද, තේ අපනයන්හි සාමාන්‍ය මිල 2014 ජනවාරි මාසයේදී වාර්තා වූ ඉහළම අගයෙහි සිට 2014 පළමු මාස 5 තුළදී ක්‍රම ක්‍රමයෙන් පහත වැටුණි. සුළු කෘෂිකාර්මික නිෂ්පාදන සහ මුහුදු ආහාර අපනයන අදායම් ද කෘෂිකාර්මික අපනයන්හි වර්ධනය සඳහා සැළකිය යුතු ලෙස දායක විය. කෙසේ වුවද, 2013 මැයි මාසය සමඟ සැසඳීමේදී 2014 මැයි මාසයේදී රබර් අපනයන ආදායම සියයට 21.0 කින් අඩු විය. ප්‍රධාන රබර් පාරිභෝගිකයන්ගෙන් පැවති ඉල්ලුම අඩුවීම සහ වියට්නාමය, තායිලන්තය සහ ඉන්දුනීසියාව වැනි රටවල නව වගාවන්හි නිෂ්පාදනය ඉහළ යෑම හේතුවෙන් අපනයන මිල ගණන් සහ පරිමාවන් අඛණ්ඩව පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.


### ආනයන ක්‍රියාකාරිත්වය

අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන කාණ්ඩ දෙකෙහිම ආනයන අඩුවීම හේතුවෙන් 2014 මැයි මාසයේදී ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,275 ක් දක්වා සියයට 17.6 කින් පහත වැටුණි. අන්තර් භාණ්ඩ ආනයන වියදම පසුගිය වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 717 ක් දක්වා සියයට 21.0 කින් අඩු වූ අතර, බොරතෙල්, දියමන්ති සහ රත්තරන් ආනයනයේ සිදුවූ සැළකිය යුතු අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. මැයි මාසයේදී පැවති රත්තරන් ආනයනය, ඉතා සුළු අගයක් ගත් බැවින් 2014 මැයි මාසයේදී රත්තරන්, වටිනා ගල් සහ ලෝහ ආනයනය එ.ජ. ඩොලර් මිලියන 13.2 ක් දක්වා සියයට 87.0 කින් අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. 2014 මැයි මාසයේදී ඉන්ධන ආනයන වියදම සියයට 35.4 ක තාවකාලිකව අඩුවීමක් පෙන්නුම් කළ අතර, තෙල් නළ පද්ධතියේ නඩත්තු කටයුතු හේතුවෙන් මෙම මාසය තුළදී බොරතෙල් ගොඩබෑම ප්‍රමාද වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. අන්තර් භාණ්ඩ ආනයන වියදම අඩුවීම සඳහා දායක වෙමින් තිරිඟු සහ සකස් නොකළ දුම්කොළ ආනයන වියදම්ද පිළිවෙළින් සියයට 42.8 කින් සහ 75.8 කින් අඩු විය. කෙසේවුවද, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, පොහොර සහ කඩදාසි හා සන කඩදාසි ආනයන වියදම් සළකාබලන ලද කාලය තුළදී වර්ධනය විය. ඉදිරි මාස සඳහා වූ අපනයන ඇනවුම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින් රෙදිපිළි හා රෙදපිළි උපාංග ආනයනය පසුගිය වසරට සාපේක්ෂව සියයට 11.2 කින් වර්ධනය විය. තවද, 2014 මැයි මාසයේදී පොහොර ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 32 ක් දක්වා සියයට 36.7 කින් වර්ධනය විය. වී සහ අනෙකුත් වගාවන් සඳහා යල කන්නයේදී සහ එළඹෙන මහ කන්නයේදී පොහොර භාවිතය වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

මෑත කාලයේදී භාණ්ඩ තොග ගොඩනගා ගැනීම් පෙන්නුම් කරමින් 2014 මැයි මාසයේදී ආයෝජන භාණ්ඩ යටතේ ඇති ප්‍රධාන කාණ්ඩයන් සියල්ලකම ආනයන අඩුවීම හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 280 ක් දක්වා සියයට 25.2 කින් අඩු විය. යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදම සියයට 34.4 කින් අඩු වූ අතර, රෙදිපිළි කර්මාන්තය ආශ්‍රිත යන්ත්‍රසූත්‍ර, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය උපකරණ සහ හස්ත කර්මාන්තය ආශ්‍රිත උපකරණ හා මෙවලම් හැර අනෙකුත් යන්ත්‍රසූත්‍ර හා උපකරණ කාණ්ඩයන් සියල්ලකම පාහේ ආනයන අඩුවීම මේ සඳහා හේතු විය. ප්‍රධාන වශයෙන් යකඩ වානේ සහ සිමෙන්ති ආනයන අඩුවීම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම සියයට 8.7 කින් අඩු විය. ප්‍රවාහන උපකරණ ආනයන සියයට 20.5 කින් අඩු වූ අතර, බස්රථ හා අහස්යානා කොටස් හැර අනෙකුත් උපකාණ්ඩයන් සියල්ලකම ආනයන අඩුවීම මේ සඳහා හේතු විය.

මේ අතර, ආහාරමය සහ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයන් දෙකෙහිම ආනයන්හි වැඩිවීම් පිළිබිඹු කරමින් 2014 මැයි මාසයේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 278 දක්වා පසුගිය වසරට සාපේක්ෂව සියයට 4.2 කින් වර්ධනය විය. ආහාර ආනයන සැළකූ විට ප්‍රධාන වශයෙන් සහල් ආනයනයේ සැළකිය යුතු වර්ධනය හේතුවෙන් ධාන්‍ය සහ ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සඳහා වූ වියදම සැළකිය යුතු ලෙස වැඩි විය. කෙසේවුවද, 2014 මැයි මාසයේදී එළවළු, තෙල් හා මේද, මුහුදු ආහාර සහ පළතුරු ආනයන වියදම අඩු විය. ප්‍රධාන වශයෙන් රථවාහන ආනයන වියදම සියයට 10.3 කින් සහ රෙදිපිළි හා උපාංග ආනයන වියදම සියයට 41.4 කින් වර්ධනය වීම හේතුවෙන් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 0.4 කින් සුළු වශයෙන් වර්ධනය විය. කෙසේවුවද, 2014 මැයි මාසයේදී ගෘහ උපකරණ සහ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයනය අඩු විය.



**ගෙවුම් තුලනයේ සේවා ගිණුම යටතේ වන සංචාරක ඉපැයුම්**

2014 වසරේ මැයි මාසය දක්වා සමුච්චිත සංචාරක පැමිණීම් 624,178 දක්වා සියයට 26.5 කින් වර්ධනය විය. 2014 වසරේ පළමු මාස පහ තුළදී සමුච්චිත පදනම මත සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් මිලියන 901.8 දක්වා සියයට 35.8 ක ඉහළ වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, ජුනි මාසය තුළදී සංචාරක පැමිණීම් 103,175 දක්වා සියයට 14.3 කින් වර්ධනය වූ අතර, සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් මිලියන 149.1 දක්වා සියයට 22.7 කින් ඉහළ ගියේය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, මාලදිවයින සහ ඕස්ට්‍රේලියාව 2014 වසරේ ජුනි මාසය තුළදී සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර පහ වූ අතර, මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 47 කට පමණ මෙම මූලාශ්‍ර දායක විය.

**ගෙවුම් තුලනයේ ජංගම සංක්‍රාම**

2014 වසරේ මැයි මාසයේදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2013 වසරේ මැයි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 512.4 සිට එ.ජ. ඩොලර් මිලියන 557.5 දක්වා සියයට 8.8 කින් වර්ධනය විය. 2014 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාල පරිච්ඡේදය තුළදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2013 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,510.7 සිට එ.ජ. ඩොලර් මිලියන 2,774.8 දක්වා සියයට 10.5 කින් වර්ධනය විය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඛණ්ඩව වර්ධනය වීමට වෘත්තීය හා පුහුණු අංශයට අයත් ශ්‍රම සංක්‍රමණ ඉහළ යාම තවදුරටත් දායක වේ.

**ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම**

2014 වසරේ ජනවාරි සිට මැයි මස අග දක්වා රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 229.4 ක් වූ අතර, එය පිළිවෙළින්, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 92.3 ක සහ එ.ජ.ඩොලර් මිලියන 137.1 ක ශුද්ධ ලැබීම්වලින් සමන්විත විය. 2014 වසරේ මැයි මස අග දක්වා 2014 වසර තුළදී රජය විසින් ලබාගත් දිගුකාලීන ණය, 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 685.3 සමග සැසඳීමේදී එ.ජ. ඩොලර් මිලියන 820.9 විය. මේ අතර, 2014 වසරේ පළමු මාස පහ තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත වූ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 93.8 ක් විය. තව දුරටත්, 2014 මැයි මාසය තුළදී කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ විදේශීය ලැබීම් 2013 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 35.4 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 69.9 ක් විය. සමුච්චිත පදනම මත 2014 වසරේ මැයි මස අවසානය දක්වා කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 19.3 ක් විය.

### ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය

2014 වසරේ මැයි මස අවසානය දක්වා සමස්ත ගෙවුම් තුලනය, 2013 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 126.5 ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,667.6 ක අතිරික්තයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර තිබේ.

### ජාත්‍යන්තර සංචිත

2014 වසරේ මැයි මාසය අවසානයේ දී ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 8.8 ක් වූ අතර, බැංකු අංශයේ විදේශීය වත්කම් ද ඇතුළුව මුළු විදේශීය වත්කම් ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 10.2 ක් විය. ආනයනික මාස වශයෙන් සැලකූ විට, 2014 වසරේ මැයි මස අවසානයේදී දළ නිල සංචිත ආනයනික මාස 5.9 කට සමාන වූ අතර, මුළු විදේශීය වත්කම් ආනයනික මාස 6.9 කට සමාන විය. එ.ජ. ඩොලර් මිලියන 987.4 ක විදේශ ණය සේවාකරණ ගෙවීම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම් සඳහා වූ එ.ජ. ඩොලර් මිලියන 264.7 ක ගෙවීම් පැවතිය ද විදේශීය සංචිත සැලකිය යුතු යහපත් මට්ටමක පවත්වා ගැනුණි.

### විනිමය අනුපාතිකයේ හැසිරීම

2014 වසරේ ජූලි මස 11 වැනි දින දක්වා කාලපරිච්ඡේදයේ දී එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල ආන්තික වශයෙන් සියයට 0.40 කින් අධිප්‍රමාණය වීම සමග, වසරේ මේ දක්වා කාලය තුළ දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවතුණි. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල යූරෝවලට එරෙහිව සියයට 1.9 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 0.2 කින් සහ චීන රෙන්මින්බිවලට එරෙහිව සියයට 2.8 කින් ද අධිප්‍රමාණය විය. මේ අතර, මෙම කාලසීමාව තුළ දී ශ්‍රී ලංකා රුපියල ජපන් යෙන්වලට එරෙහිව සියයට 3.1 කින් ද, ස්ටර්ලිං පවුමට එරෙහිව සියයට 3.4 කින් ද, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 2.5 කින් ද, සිංගප්පූරු ඩොලරයට එරෙහිව සියයට 1.5 කින් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 4.6 කින් ද අවප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 1. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් - 2014 ජනවාරි - මැයි (අ)

| කාණ්ඩය | 2013 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2014 මැයි (එ.ජ.ඩො. මිලියන) | මැයි වර්ධනය (සියයට) | 2013 ජන. සිට මැයි (එ.ජ.ඩො. මිලියන) | 2014 ජන. සිට මැයි (එ.ජ.ඩො. මිලියන) | ජන. සිට මැයි වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **793.9** | **882.1** | **11.1** | **3,848.8** | **4,453.2** | **15.7** |
| මෙයින්: | | | | | | |
| කෘෂිකාර්මික | 197.9 | 239.9 | 21.2 | 924.7 | 1,100.6 | 19.0 |
| මෙයින්: තේ | 128.2 | 140.6 | 9.7 | 568.1 | 644.4 | 13.4 |
| කාර්මික | 592.8 | 638.6 | 7.7 | 2,910.9 | 3,304.8 | 13.5 |
| මෙයින්: රෙදිපිළි හා ඇඟළුම් | 318.9 | 365.1 | 14.5 | 1,643.9 | 1,966.7 | 19.6 |
| රබර් නිෂ්පාදිත | 68.0 | 78.0 | 14.6 | 328.2 | 360.3 | 9.8 |
| ආහාර පාන හා දුම්කොළ | 16.7 | 22.6 | 35.7 | 86.3 | 121.4 | 40.7 |
| ඛනිජ ද්‍රව්‍ය | 2.4 | 2.8 | 16.3 | 8.3 | 42.2 | 407.1 |
| **ආනයන** | **1,548.8** | **1,275.5** | **-17.6** | **7,584.7** | **7,467.9** | **-1.5** |
| මෙයින්: | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 266.6 | 277.8 | 4.2 | 1,250.5 | 1,322.1 | 5.7 |
| මෙයින්: ආහාර හා පාන වර්ග | 127.0 | 137.6 | 8.4 | 583.8 | 584.3 | 0.1 |
| ආහාරමය නොවන- පාරිභෝගික භාණ්ඩ | 139.6 | 140.2 | 0.4 | 666.7 | 737.8 | 10.7 |
| අන්තර් භාණ්ඩ | 907.2 | 717.0 | -21.0 | 4,435.5 | 4,589.6 | 3.5 |
| මෙයින්: ඛනිජ තෙල් | 323.3 | 208.9 | -35.4 | 1,764.3 | 1,970.6 | 11.7 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 158.6 | 176.4 | 11.2 | 809.0 | 884.4 | 9.3 |
| ආයෝජන භාණ්ඩ | 373.7 | 279.7 | -25.2 | 1,893.7 | 1,550.8 | -18.1 |
| මෙයින්: යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 217.8 | 142.9 | -34.4 | 996.4 | 843.8 | -15.3 |
| ප්‍රවාහන උපකරණ | 41.5 | 33.0 | -20.5 | 289.4 | 196.6 | -32.1 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 113.5 | 103.6 | -8.7 | 605.3 | 509.3 | -15.9 |
| **වෙළෙඳ ශේෂය** | **-754.9** | **-393.4** | **-47.9** | **-3,735.9** | **-3,014.7** | **-19.3** |
| **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** | **512.4(ආ)** | **557.5** | **8.8** | **2,510.7** | **2,774.8** | **10.5** |
| **සංචාරක ඉපැයුම්** | **100.7(ආ)** | **130.1** | **29.2** | **663.9** | **901.8** | **35.8** |
| **විවිධ ආයෝජන (ශුද්ධ)** | **35.4** | **69.9** | **97.5** | **107.6** | **19.3** | **-82.1** |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ඇ)** | **269.6** | **157.2** | **-41.7** | **2,401.7** | **3,201.1** | **33.3** |
| එයින්: | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 125.8 | 92.8 | -26.3 | 1,707.7 | 874.9 | -48.8 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | | | | | 1,500.0 | |
| දිගුකාලීන ණය | 142.2 | 64.4 | -54.7 | 685.3 | 820.9 | 19.8 |
| **සෘජු විදේශ ආයෝජන (ඈ)** | | | | **219.0** | **442.3** | **102.0** |

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඈ) එක් එක් කාලපරිච්ඡේදය සඳහා අදාළ දත්ත පළමු කාර්තුව සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ විදේශීය ණය ද ඇතුළත් කොට ඇත.